සකර ගමනක් නිමා කළේ උමා ඇතුළු එහි ගමන්ගත් මගීන්ට ද වෙහෙසකර අත්දැකීමක් ලබා දෙමිනි. මුල් වරට රථින් පිට වී මෙවැනි දුෂ්කර ගමනක නුදුකලාවේම යෙදෙන්නට තරම් ධිර්ගීත වන උමාට මෙන්ම එහිදී ඇයට හමු වන අන් මගීන්ට ද, ගෙවන්නට සිදු වන්නේ දුෂ්කර ගමනකි. එම නෞකාවේම ගමන් ගත් (ගමන අතරමගදී මරණයට පත් වන) වැඩිහිටි සිංහල කාන්තාව, උමාට වෙන්ව තිබූ කුටියේ හවුල් කාරිය වූ නීලා නම් සුරූපී තරුණියත් ඇයගේ දරුවාත්, නැව් තට්ටුවේ එකට එක් වී සිටි ලාංකික තරුණ පිරිස ඇතුළු මේ සියල්ලන්ම ගැන විටින් විට අඩුවැඩි වශයෙන් තොරතුරු ගෙනහැර දක්වන කතුවරිය ඒ සියල්ල අභිභවා කිසියම් ප්‍රේමාන්විත හැඟීමක ආස්වාදයක් ද ඉඟියෙන් මෙන් ඉදිරිපත් කරයි. නැව් තට්ටුවේ එක්රොක්ව සිටි ශ්‍රී ලාංකික තරුණයින් දහ දොළොස් දෙනා අතුරෙන් උමා කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වන සුමන නමැති තරුණයාත් ඔහුගේ හැඟීම් ප්‍රකාශනයත් පිළිබඳ කිසියම් දුරකට ආස්වාදජනක තොරතුරු කිහිපයක් විටින් විට ගෙන හැර දක්වන කතුවරිය එමගින් තරුණ පාඨකයින්ගේ හදවත්වලට බිංදු මාත්‍රයක හෝ ප්‍රීතිමත් බවක් ඇති කර ලයි. නෞකාවේදී මෙලෙස හමු වන සුන්දර තරුණයා උමා කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වන අයුරු නෞකා ගමන අතරතුරදීත් ඉන් පසුවත් විටින් විට ගෙන හැර දැක්වෙන නමුත් පාඨකයා බොහෝ දුරට අපේක්ෂා කරනු ඇතැයි සිතෙන අන්දමේ දැඩි බැඳීමක් හෝ විවාහයක් දක්වා තදින් දිවෙන ප්‍රේම සම්බන්ධතාවක් හෝ නොවී අතරමගදී මතකයෙන් ගිලිහී යන හැසිරීමක් බවට පත් වෙයි.

තරුණ තරුණියන් කිසිදු පූර්ව අත්දැකීමකින් තොරව මෙලෙසට විදේශීය රටවල් කරා යද්දී දිගින් දිගටම ඔවුන් ලබන නව අත්දැකීම් සමුදායක් නවකතාව පුරාම දිස් වෙයි. ප්‍රංශයේදී නැවෙන් ගොඩ බසින අවස්ථාවේදී සිය පියාණන්ගේ මිතුරකු හමු වී ඔහුගෙන් උදව් ලබාගන්නා ආකාරය ද කතුවරිය විශ්වසනීයත්වය ගොඩනැගෙන සේ ඉදිරිපත් කර ඇති ආකාරය අගනේය. ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සිංහල තරුණියක් තමනට සුපුරුදු සාරියයන්ම සරසී මෙසේ විදෙස්ගත වන ආකාරය නවකතාවේ පැහැදිලිවම දක්වා ඇති තත්වයයි. නෞකාවේදී උමාට හමු වන නීලා බටහිර පන්තයට ඇඳ සිටියත් උමා තවදුරටත් සාරියයන්ම සරසී සිටියි. ඇය මුහුණ දෙන දේශගැණයට ඔරොත්තු දෙන ලෙස කබායක් ඒ මතින් අඳඟන්නට නීලාගෙන් ඇයට උපදෙස් ලැබෙන අයුරුත් එම අවස්ථාවේදී තමා ගෙන ආ කබායේ ඇඳුපාඩු නිසා ඇයට දැනෙන ගීතමානයත් කතුවරිය විශ්වසනීයත්වයෙන් යුතුවත් පාඨකයාගේ සිත් ඇදගන්නා පරිදිත් දක්වා ඇත.

"තාන්තා පිටකොටුවෙන් ගෙනා බේල් ජැකට්ටුව මගේ ඇඟට හොඳටම ලොකු වැඩිය. නෞකාවේදී මා සමග දැන හැඳුනුම්කම් ඇති කරගත් මිතුරන්ට පෙනෙන්නට එය ඇඳගෙන සිටීමට මට ලැජ්ජා සිතුණේය. අපේ මිතුරන් සියලු දෙනාම කලිසම් කබාවලින් සැරසී මනා පිළිවෙළටත් පහසුවෙනුත් සිටියෝය. නෞකාවේ ගමන් කළ මඳක් වැඩිහිටි සිංහල සහ දමිළ ජාතික කාන්තාවන් දෙදෙනෙකු ද සුපුරුදු ලෙසින් සාරිවලින් සැරසී සිටීම මගේ මඳ සැනසීමට හේතු විය." (42 පිට)

දිගු ගමන් මගක් ගෙවා ජර්මනියට සේන්දු වන උමා එහිදී හඳුනාගන්නා අලුත් පිරිස, විදේශීය මිතුරු මිතුරියන් සහ ඔවුන්ගේ පවුල්වල වැඩිහිටියන් ද ඇතුළු බොහෝ දෙනා සමග එකතුව සුහදතාවෙන් යුතුව තම අධ්‍යයන හා පුහුණු වීම් කටයුතු කරගෙන යන ආකාරය දක්වමින් කතාව ඉදිරියට රැගෙන යාමට කතුවරිය සමත් වී ඇත. ඒ අතරතුර මවගෙන් ඇය වෙත ලිපියක් ලැබෙන අවස්ථාව කාගේ වුවද සිත් තුළ හැඟීම්බර බවක් ඇති කරවනු නොඅනුමානය.

"මම මේසය අසල වූ පුටුවෙහි හිඳගෙන ප්‍රවේසමෙන් කවරය ඉවත් කොට එතුළ වූ ලිපිය අතට ගන්තෙමි. අම්මාගේ මුතු කැට වන් අකුරු මගේ මුවගට සිනාවක් රැගෙන ආවේ නිරායාසයෙනි. සම්මා සම්බුදු සරණයි. සදාදරණීය ලොකු දුව වෙත ලියමි. ------"

මා නැති නිවසේ පාළුව, මා නැති නිවසේ අඩුව, මා දක්නට නැතිව ඇගේ හදවතේ ඇති වේදනාව ද පැහැදිලි කරමින් ද, මා සිහිපත් කරමින් තාත්තා, නංගී සහ මල්ලිලා කරන කියන නොයෙකුත් දෑ විස්තර කරමින් ද අම්මා ලියා ඇති ලිපිය ෆුල්ස් කැප් පිටු දෙකක් පුරාම විහිදී තිබුණේය. ------" (73, 74 පිටු)

'හිමකැට සෝපානය' නවකතාව මගින් තරුණ වියේ පසුවන දියණියන්ට, විශේෂයෙන්ම විදෙස් ගමන්වලට සූදානම් වන අයට හා මතු අනාගතයේදී එවැනි ගමන් අපේක්ෂා කරන අයට ද ජීවිතයේ විවිධ අවස්ථා පිළිබඳවත්, ඒවාට මුහුණ දීමේදී ලබන්නට සිදු වන අත්දැකීම් පිළිබඳවත් බොහෝ දුරට සරලව අවස්ථා හා සිදුවීම් ඉදිරිපත් කිරීම කතුවරියගේ අපේක්ෂාව වී ඇති බව පෙනේ.

හෙදියක වීම සඳහා ඉගෙනීමට ජර්මනියට යන උමා එහි හෙද විදුහලේ ගෙවන ජීවිතයට අමතරව නේවාසිකාගාරයේදී ජර්මන් ජාතික ශිෂ්‍යාවන් සමග මිත්‍රත්වයෙන් ගෙවන ජීවිතය සුහදතාව පිරුණු එකක් ලෙස නිරූපණය වී ඇත.

"අපි දෙන්නට සුබම සුබ නත්තලක්ක"

කවරයෙන් එළියට ගත් ලිපියක් සුරතින් ඉහළට ඔසවාගෙන පිනා මා වෙත පැමිණියේ දඟකාර දැරියක ලෙසින් නැටුමක් තටමින්ය. මා සිටියේ සෝදා ඉස්ත්‍රික්ක කළ ඇඳුම් බත්ති අල්මාරියේ අසුරමින්ය. පිනා මා වෙත පැමිණ උරහිස වටා අත දමා සමීප වී කම්මුලට හාද්දක් දුන්නාය.

"නත්තලට තව දවස් දහයක් තියෙනව නේ. ඉතින් මොකද දැන්ම ඉඳන් මේච්චර සතුටක්?" මම සිනාසී ඇසුවෙමි. "කාරණේ මේකයි. මේ නත්තලට මගේ දෙමව්පියන් බලන්න මම ගමට යන්නෙ මගේ ශ්‍රී ලාංකික මිතුරියත් එක්කගෙන නේ." ඈ තවත් පුංචි නැටුමක් නැටුවාය. (78 පිට)

විශ්ව සමාජය තුළ ජාති, ආගම් භේද නොතකා සියල්ලන්ටම සතුටෙන් හා සමගියෙන්, සුහදව කල් ගෙවන්නට හැකි බව මෙවන් අවස්ථා නිරූපණය මගින් ලේඛිකාව පාඨක සමාජයට දෙන තවත් පණිවුඩයකි. අන් කවර සීමා මායිම් තිබුණද, යහපත් සිතුවිලි සමග එක් වන මනුෂ්‍යත්වයේ උත්තරිතර ස්වභාවය මගින් එවැනි සුහද මිනිස් සමාජයක් ගොඩ නංවන්නට නොහැකි නොවනු ඇත යන්න මෙබඳු අවස්ථා නිරූපණයෙන් වටහාගත හැකිය.

'හිමකැට සෝපානය' පාඨකයාට පහසුවෙන් කියවා රස විඳගත හැකි නවකතාවකි. ජීවිතයේදී මිනිසුන් මුහුණ දෙන අනේකප්‍රකාර ප්‍රීතිමත් හා දුක්බර අත්දැකීම් යම් තරමක් දුරට හෝ තමන්ට ද පාලනය කරගත හැකි වේය යන්න කතුවරිය මෙහිදී පළ කිරීමට අපේක්ෂා කරන තවත් අදහසක් විය හැකිය. තරුණ තරුණියන් ප්‍රේමය පිළිබඳ තම හැඟීම් හා අත්දැකීම් වුව කිසියම් පාලනයකින් යුතුව සංවිධානය කර ගතහොත් ඔවුනට තම ඉලක්කය දක්වා යාම අපහසු නොවනු ඇතැයි ද උමාගේ චරිතය මගින් ඉගැන්වෙන තවත් පාඩමකි. තමන්ට ආදරය පාමින් ළං වන කවරකු හෝ වැඩි දුර නොසිතා නොබලා ළං කර ගැනීමෙන් සිදු වන වාසිවලට වඩා අවාසි ද තිබිය හැකිය.

'උමා' යනු නූතන ලෝකයට සරිලන කාන්තා චරිතයකි. තම ඉලක්කය පැහැදිලිව සිත්හි දරාගනිමින් ධිර්ගීත ලෙස ඉදිරියට පිය නගන ඇය, ගිරි ශිඛරය නැග යද්දී අපහසුවෙන් එම ගමන යයි. අනතුරුව ජර්මනියේදී තම පාඩමාලාව අවසානයේදී ආපසු සිය රටට පැමිණ තමන්ගේ අභිමතය වූ ආර්ථික ප්‍රයෝජන අභිමි කර ගනු වෙනුවට ධෛර්යමත්ව දරන ප්‍රයත්නය සාර්ථක ප්‍රතිඵල අත් කර දෙයි.

කතුවරිය මෙම ආදර්ශවත් චරිතය ගොඩනැංවීමේදී ඇයගේ සිත තුළ සනිටුහන් වූ සැබෑ චරිතයක ඡායාව ද ඊට යොදාගනිමින් ධනාත්මක ලෙස සිතන්නට හා ක්‍රියා කරන්නට නූතන තරුණ පරපුර යොමු කරවීමට අදහස් කළා සේය. ඉතින් දැක්වූ පරිදි ජීවිතය යනු කටු කොහොල්, බාධක අභිභවා යා යුතු දිගු ගමනකි. එය දුෂ්කර ගමනකි. එසේ වුවද එහි දුෂ්කර බව පුද්ගලයාගෙන් පුද්ගලයාට මෙන්ම අවස්ථාවෙන් අවස්ථාවට ද වෙනස් වනු ඇත. ජීවිතයේදී අප සමග රැඳෙන දෛවය පිළිබඳව ද විශ්වාසයකින් යුතුව මෙම චරිතයත් එය ගොඩනැංවීමට ගොතන ලද කතා වස්තුවත් ගැන සිතා බැලීමට ද මෙම ලේඛිකාව පාඨකයාට ඉඩ සලස්වා දෙයි. උමා නමැති කථා නායිකාව අවසානයේදී ලබන ජයග්‍රහණය කරා ගමන් කරන්නේ හුදෙක් රෝස මල් ඇතිරූ පලසක් මතින් නොවේ. තමන් වෙත ඇඳී එන කවර ගැටලු හෝ ඉවසීමෙන් යුතුව, කල්පනාකාරීව විසඳාගැනීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය සහිත මෙවන් ධනාත්මක චින්තනයෙන් යුතු ගැහැනු ළමයින් කවර සමාජයකට හෝ සම්පතක් වන බව ස්වර්ණකාන්ති රාජපක්ෂ 'හිමකැට සෝපානය' මගින් මතු කර දක්වයි.

IMMIGRATION LAW @
Australian Immigration Law firm
of the Sri Lankan Community

We are proud to have lead the way
for others to follow...

Professional Immigration
Legal Services
Legal Advice in simple to complex
Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced
Lawyers & Registered Migration Agents

Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com

We Deliver Results...